## ශ්‍රී ලංකා තේ මණ්ඩලය
## 574, ගාලු පාර, කොළඹ 03.

### ඉතිහාසය කෙටියෙන්

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 1976 ජනවාරි 01 වන දින තේ පාලන දෙපාර්තමේන්තුව, තේ අපනයන කොමසාරිස් දෙපාර්තමේන්තුව, ලංකා තේ ප්‍රචාරක මණ්ඩලය සහ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය යන ආයතන ඒකාබද්ධ කිරීමෙන් 1985 අංක 17, 1990 අංක 14, 2003 අංක 29 සහ 2006 අංක 44 දරණ පනත් මගින් සංශෝධිත 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතේ ස්ථාපනය කරන ලදී.

වර්ෂ 1994 දී තේ පර්යේෂණ ආයතනය ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය යටතින් නිදහස් කෙරුණු අතර එය 1993 අංක 52 දරණ තේ පර්යේෂණ මණ්ඩල පනත මගින් තේ පර්යේෂණ මණ්ඩලය යටතට පමුණුවන ලදී.

උක්ත පනත මගින් ස්ථාපනය කෙරුණු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූලික අරමුණු වනුයේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ තේ ලොව පුරා ප්‍රචලිත කිරීම සහ තේ කර්මාන්තය නිසිලෙස නියාමනය සඳහා අවශ්‍ය විධිවිධාන ක්‍රියාත්මක කිරීම වේ. තේ කර්මාන්තයට අදාළ ප්‍රමුඛතම ව්‍යවස්ථාපිත බලතල සහිත කාර්යභාරයන් වනුයේ තේ නිෂ්පාදනය, වගාකිරීම සහ නැවත වගා කිරීම, තේ කර්මාන්තශාලා ස්ථාපනය, කොළඹ තේ වෙන්දේසිය හැසිරවීම, තේ වල ගුණාත්මක තත්ත්වය, ඇසුරුම්කිරීම සහ ගබඩා කිරීමේ පහසුකම් පවත්වාගැනීම ආදිය වන අතර ඒවා ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය සහ 1957 අංක 51 දරණ තේ පාලන පනතින්ද 1959 අංක 16 දරණ තේ (බදු සහ අපනයන පාලන) පනතින්ද බලගන්වා ඇත.

### ප්‍රධාන අංශ

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය
තේ කොමසාරිස් අංශය
තේ ප්‍රචාරණ අංශය
වෙළඳපොල බුද්ධි හා සම්පත් අංශය
විශ්ලේෂණ රසායනාගාරය
තේ රස පරීක්ෂණ ඒකකය

### අරමුණු

- ඉදිරි වසර 5 තුළ 2%ක වාර්ෂික වෙළඳපල වර්ධනයක් පවත්වා ගැනීම.
- විධිමත් කෘෂිකාර්මික ක්‍රමවේදයන් සහ නිෂ්පාදන ක්‍රියාවලීන් අනුගමනය කරන බවට සහතික කිරීම.
- වර්ෂ 2012 වන විට සමස්ත තේ අපනයනවලින් අගය වැඩිකළ නිමි තේ ප්‍රමාණය 35% සිට 60% වැඩිකරන අතර ඊට සමගාමීව තේ කිලෝග්‍රෑම් එකක් නැව්ගත කිරීම දක්වා ලබන ආදායම (FOB) ඇ.ඩො. 2 සිට ඇ.ඩො. 4 දක්වා වැඩි කිරීම.
- වත්මන් වෙළඳපල ආරක්ෂා කර ගැනීම, පාඩු ලබන වෙළඳපල ලාභ ලබන තත්ත්වයට පත්කිරීම සහ නව වෙළඳපල සඳහා මං පෙත් පාදා ගැනීම.
- තේ කර්මාන්තයට අදාළ සෑම නෛතික කරුණක්ම නැවත විචාරයට ලක්කිරීම සහ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වියයුතු බලයලත් නීතිය, 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල නීතිය ලෙස බල ගැන්වීමට පියවර ගැනීම.
- වර්ෂ 2008 වන විට වෙළඳපල බුද්ධි හා සම්පත් අංශය, වඩාත් ක්‍රියාකාරී අංශයක් බවට පත්කිරීම.

## ක්‍රියාකාරකම්

- ජාත්‍යන්තර වෙළඳපලට ගුණාත්මක තේ සැපයීමේ නායකත්වය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ තේ අපනයනයේ යෙදී ඇති සමස්ත වෙළඳපල සංවර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම.
- විදේශීය පාරිභෝගියන්වද තෘප්තිමත් කරන අතරම තේ වගා කරන්නන්, නිෂ්පාදකයින් සහ අපනයනකරුවන්හට ආර්ථික වශයෙන් අපහසුවකින් තොරව ක්‍රියාත්මක කළ හැකි අළුත් ක්‍රමෝපායයන් තුළින් ජාත්‍යන්තරව පිළිගත් ගුණාත්මක තත්ත්වයන් ළඟා කරගන්නා ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- නිෂ්පාදිත සහ වෙළඳපල විවිධාංගීකරණය සඳහා දිරිදීම.
- තේ කර්මාන්තයේ වත්මන් සහ අනාගත අවශ්‍යතා ඉටුකර ගැනීමට අවශ්‍ය නෛතික රාමුව විවරණය කිරීම.
- තේ කර්මාන්තයේ ප්‍රයෝජනය සඳහා දෛනිකව සැපයිය හැකි බුද්ධි තොරතුරු වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි මගක් සැකසීම.

## සම්බන්ධවිය හැකි පුද්ගලයන්

| නම | දුරකථනය | ෆැක්ස් අංකය | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| සභාපති, ලලිත් හෙට්ටිආරච්චි මහතා | 2585701 | 2589132 | chairman@pureceylontea.com |
| අධ්‍යක්ෂ ජනරාල්, එච්.ඩී. හේමරත්න මහතා | 2508991 | 2589132 | dgsltb@pureceylontea.com |
| තේ කොමසාරිස්, වී.ජේ.සී.එන්. උඩුගම්පොල මහතා | 2580182 | 2580161 | teacomm@pureceylontea.com |
| සාමාන්‍ය | 2587814<br>2587773<br>2582121 | | |

**වෙබ් අඩවිය:** www.pureceylontea.com